# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

**1952 = 100**




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වැටුප්

රජයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් 1978 ට වඩා වේගයෙන් 1979 දී ඉහළ නැග ඇති බව පවත්නා දත්ත අනුව පෙන්නුම් කෙරේ. පසුගිය වර්ෂයේ සියයට 12 කින් වැඩි වූ කාර්මික හා ලිපිකරු සේවකයින්ගේ මූල්‍ය වැටුප් 1979 දී සියයට 16 කින් වැඩි විය. සුළු සේවකයින් හා රජයේ ගුරුවරුන් ගැන සලකා බලන විට මූල්‍ය වැටුප්වල වැඩිවීම 1978 දී පිළිවෙලින් සියයට 16 ක් හා සියයට 10 ක්වූ අතර, මෙම වර්ෂයේ එය සියයට 21 ක් හා සියයට 15 ක් විය. මෙම වැඩිවීමට හේතුවූයේ ජනවාරි මාසයේ මාසික ඒකාබද්ධ වැටුප සියයට 10 කින් වැඩිකිරීම හා සැප්තැම්බර් මාසයේදී තවත් රුපියල් 55 ක අතිරේක මාසික දීමනාවක් පිරිනැමීමයි.

කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය යොදා මණිනු ලබන රජයේ සේවකයින්ගේ මූර්ත වැටුප් වැඩි වූයේ මූල්‍ය වැටුප් වර්ධන අනුපාතයට වඩා අඩු අනුපාතයකිනි. කෙසේ නමුත් මෙය මූර්ත වැටුපේ අඩුවීමක් පෙන්නුම් කළ 1978 වර්ෂයට වඩා හොඳ දියුණුවක් පෙන්නුම් කරන්නකි කාර්මික හා ලිපිකරු සේවකයින්ගේ මූර්ත වැටුප සියයට 5 කින් වැඩි වූ අතර, පසුගිය වර්ෂයේ එය ස්ථායීව පැවතුණි. 1978 දී සියයට 1 කින් අඩුවූ රජයේ ගුරුවරුන්ගේ මූර්ත වැටුප 1979 දී සියයට 4 කින් වැඩි විය. මේ අතර, සුළු සේවකයින්ගේ මූර්ත වැටුප පසුගිය අවුරුද්දේ සියයට 4 ක වැඩිවීම හා සසඳන විට, 1979 වර්ෂයේ සියයට 9 කින් වැඩිවිය.

1979 දී වේතන මණ්ඩල රෙගුලාසිවලට යටත්වන පෞද්ගලික අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 27 කින් වැඩි විය. කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 28 කින් වැඩිවූ අතර, කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයින්ගේ වැටුප් සියයට 17 කින් වැඩිවිය. මූල්‍ය වැටුප්වල වර්ධනය කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය යොදා වට්ටම් කළ විට, කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 15 කින් ද, කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 5 කින් ද වැඩි විය.

කෙසේවුවද, රජයේ සේවකයින් සඳහා වන මහ බැංකු වැටුප් අනුපාත දර්ශක පදනම් වී ඇත්තේ රජයේ සේවකයින්ට ඒ ඒ පරිමාණ අනුව ගෙවිය යුතු වැටුප් හා වේතන මත බව සැළකිය යුතුය. වැටුප් මණ්ඩල වලට යටත්වන පෞද්ගලික අංශයේ කෘෂිකර්ම, කර්මාන්ත හා වාණිජ අංශ සඳහා වූ කම්කරු දෙපාර්තමේන්තුවේ වැටුප් දර්ශක වලට ඇතුළත්ව ඇත්තේ එම වැටුප් මණ්ඩල මගින් අනුමත අවම වැටුප් සහ 1967 දෙසැම්බර් සිට ගෙවනු ලබන "අවප්‍රමාණ දීමනාව" පමණි. මේ අනුව වැටුප් දර්ශකවලට අතිකාල දීමනා හා දිරිගැන්වීමේ දීමනා ඇතුළත් නොවේ. මේවා ඇතුළත් නොවුවද, 1979 සාමාන්‍ය මිළ වැඩිවීම කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙන් පෙන්නුම් කරනවාට වඩා ඉතා අධික වූ අතර, කෘෂිකාර්මික අංශය හැර අනික් අංශවල මූර්ත වැටුප අඩු වූ බව පෙන්නුම් කරයි.

## සේවා නියුක්තිය

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ වෙනස්වීම පරීක්ෂා කිරිමට ඇති ප්‍රධාන සීමාවක් නම් විධිමත් හා අඛණ්ඩ සංඛ්‍යාලේඛන හිඟවීමයි. එබැවින් මෙම විශ්ලේෂණයේදී මුළු ශ්‍රම සමූහය, සේවා නියුක්ති සංඛ්‍යාව හා සේවා වියුක්ති සංඛ්‍යාව වැනි වැදගත් විචල්‍යයන් හුදෙක් අක්‍රමවත් කාලඅන්තරයන්හි කරන ලද නියැදි සමීක්ෂණ සහ ජනලේඛන මගින් ලබාගත් දත්ත මත තක්සේරුකර ඇත.

1971 ජනලේඛනයට අනුව ශ්‍රම සමූහය දශලක්ෂ 4·5 ක්වූ අතර, එය මුළු ජනසංඛ්‍යාවෙන් සියයට 35 ක් විය. මහබැංකුව මගින් පවත්වන ලද 1973 පාරිභෝගික මූල්‍ය සමීක්ෂණයට අනුව ශ්‍රම සමූහය පිළිබඳ තක්සේරුව මීට වඩා තරමක් අධිකය. 1978 මහබැංකු පාරිභෝගික,